සන්නස
SANNASA




# ඩී.බී. කුරුප්පු අනුස්මරණ කෙටිකතා

## තරගයේ ත්‍යාග සහ සහතික පත් බෙදාදීම

**"පත්වීම සහ තවත් කතා" කෙටිකතා සංග්‍රහයත් නිකුත්වෙයි**

ඩී බී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගයේ ත්‍යාග සහ සහතික පත් බෙදාදීමත් එම තරගයේ මුල්තැන ගත් කෙටිකතා 17 ඇතුළත් වන "පත්වීම සහ තවත් කතා" කෙටිකතා සංග්‍රහය නිකුත් කිරීම 2019 මාර්තු 16 වන දින නාරාහේන්පිට ශ්‍රී ගෞතම විහාරස්ථානයේදී සිදුකෙරුණි.

ලෝකය පුරා විසිරී සිටින නිර්මාණකරුවන් නිර්මාණකාරියන් දෙසියයක් පමණ ඉදිරිපත් වූ මේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්තේ ලංකා සිරිවර්ධන යි. අතුල කල්දෙමුල්ල විසින් නිර්මාණය කරන ලද ජය සංකේතය සහ රුපියල් 50000 ක ත්‍යාගය ඇය දිනා ගත්තා ය. ත්‍යාගය සඳහා අනුග්‍රහය දැක්වූයේ වෛද්‍ය නිර්මලී ජයසිංහ මහත්මියයි.

දෙවන ස්ථානය පී බී ජයසේකර මහතා දිනා ගත්තේ රුපියල් තිස්දහසක ත්‍යාගයක්ද සමගින් ය. ත්‍යාගය සඳහා අනුග්‍රහය දරන ලද්දේ අතිල් ගුණසේකර මහතා විසිනි.

තෙවන ස්ථානය දිනා ගත්තේ උදාරි මහිනාගොඩ යි. ඇයට සහතික පත්‍රයට අමරතව රුපියල් 20000 ක ත්‍යාගයක් හිමිවිය.

තරගකරුවන් දිරිගැන්වීම සඳහා වැඩිම ලකුණු ලබාගත් කෙටිකතා 17 ඇතුල් කර "පත්වීම සහ තවත් කතා" කෙටිකතා සංග්‍රහය සුරස ප්‍රකාශනයක් ලෙස නිකුත්විය. ජගත් ජේ එදිරිසිංහ විසින් සංස්කරණය කරන ලද මෙම කෙටිකතා සංග්‍රහය මෙදිනම එළිදැක්වුණ අතර ප්‍රවීණ මාධ්‍යවේදී ගාමිණී සමරසිංහ ප්‍රවීණ කතාකරු අයිටීඑන් ජාලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කැලුම් පාලිත මහීරත්න සහ ප්‍රවීණ මාධ්‍යවේදී රමේෂ් උවයිස් යන මහත්වරුන්ට මුලු පිටපත් පිරිනැමුණි.

තරගයේ විනිසුරු මණ්ඩලය කපිල එම් ගමගේ, අනුරසිරි හෙට්ටිගේ, ස්වර්ණකාන්ති රාජපක්ෂ සහ ආචාර්ය පාලිත ගනේවත්ත යන ප්‍රවීණ ලේඛක ලේඛිකාවන්ගෙන් සමන්විත විය.

කෙටිකතා සංග්‍රහයට අනුග්‍රහය දක්වන ලද්දේ සුජිත් කුරේ සහ විජිත දෙල්ගම යන මහත්වරුන් ය.

උත්සව සභාව මෙහෙයවීම ප්‍රසන්න නාමල් කුරුකුලරත්න මහතා අතින් සිදුවුණ අතර ත්‍යාග බෙදාදීම ජගත් ජේ එදිරිසිංහ මහතා අතින් සිදුකෙරුණි.

ඩී බී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගයේ සංවිධායක මන්ඩලය විජිත දෙල්ගම ගාමිණී පැළෑඳ සහ ජගත් ජේ එදිරිසිංහ යන මහත් වරුන්ගෙන් සමන්විත විය.















Photo Credit: Danusha Nattasra